www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුෂ් විධායක බලය අවධාරනය කිරීම: ජනාධිපති-මිලිටරි ආඥාදායකත්වයේ තර්කනය

## Bush’s assertion of executive power: The logic of presidential-military dictatorship

**ජෝ කේ විසිනි**

**2007 ජුලි 16**

ජුලි 11 දා ජනාධිපති බුෂ්ගේ ප්‍රවෘත්ති සාකච්ඡාවේ දී මාධ්‍ය අවධානය ඉතා මද වසයෙන් ලැබී ඇති අර්ථභාරී දෙබසක් සිදු විය. බ්ලූම්බර්ග් වෙබ් අඩවියට ලියන එඩ්වින් චෙන් බුෂ්ගෙන් මෙසේ විමසී ය: “මහජන සහාය නොමැතිව යුද්ධය ගෙන යාම ඔබට කෙතරම් අසීරු ද? ඔබ නිවැරදි යැයි සිතන දෙය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදයේ සාරය වන මහජනතාවගේ බහුතරයේ කැමැත්ත අනුව ක්‍රියා කිරීම යන දෙක අතර සමබරතාව පවත්වා ගෙන යාමේ දී ඔබ සැමදා ම කරදර වුවා නේ ද?”

බුෂ්ගේ ප්‍රතිචාරය වූයේ මහජන මතයට ප්‍රතිභාරයක් ලෙස මිලිටරියේ ක්‍රියා කලාපය අවධාරනය කිරීම යි. ඇමරිකානු මහජනතාවට ඉහලින් නැගී සිටින හා ඔවුනට විරුද්ධව පිහිටුවන ලබන තීරනාත්මක “සහයෝගී පදනමක්” ලෙස මිලිටරිය නගා සිටුවන ජනාධිපති-බලය පිලිබඳ සංකල්පයක් ඔහු සාරාංශගත කලේ ය. මෙම පදනම මත, පොදු මහජනතාව විසින් -- ජනමත විමසුම්වල දී පමනක් නොව 2006 නොවැම්බර් මධ්‍ය-වාර මැතිවරනවල දී ද -- පැහැදිලිව ම ප්‍රතික්ෂේප කරනු ලැබ ඇති පිලිවෙතක් යුක්තියුක්ත කිරීමට බුෂ් උත්සාහ කරයි.

යුද්ධයට එරෙහි මහජන විරුද්ධත්වය එක්සත් ජනපදය ජයග්‍රහනය කිරීමට අපොහොසත් වන බවට පවත්නා උත්සුකතාවන්ට ආරෝපනය කරමින් බුෂ් සිය ප්‍රතිචාරය ඇරඹී ය. “මහජනතාව යුද්ධයෙන් වෙහෙසට පත්ව සිටින්නේ මන්ද යන්න මට මුලුමනින්ම තේරුම් ගන්න පුලුවන්” යැයි ඔහු පැවසී ය. “ඔවුන්ට පවත්නා ප්‍රශ්නය මෙය යි, අපට එය ජය ගන්න පුලුවන් ද? ඔව්, ඇත්ත වසයෙන් ම, ඇමරිකානු ජනතාව මෙම සටනේ සිටිනවා ද නැද්ද යන්න ගැන මම උත්සුක වෙනවා.”

මෙය වනාහි, ඉරාකයේ යුද්ධය පමනක් නොව වඩා පුලුල් ලෙස එක්සත් ජනපද විදේශ පිලිවෙත ම අර්ථ දක්වන මිලිටරිවාදයට, ආක්‍රමනයට හා මිනිස් ජීවිත ඉව බවක් නැතිව විනාශ කිරීමට එරෙහිව පුලුල්ව පැතිර පවත්නා විරුද්ධත්වය නොතකා හැරීමේ හා එහි යුක්තියුක්ත භාවය ප්‍රතික්ෂේප කිරීමේ ප්‍රයත්නයකි. යුද්ධය වැරදි ලෙස මෙහෙයවා ඇති නිසා හා එය “ජයගත්” නොහැකි වනු ඇති නිසා නොව එය ම්ලේච්ඡ හා සාපරාධී මෙහෙයුමක් නිසා යුද්ධයට වෛර කරන ඇමරිකානුවන් දශ ලක්ෂ ගනනක් සිටී.

ඊලඟට ඒ කිසිවක් නොතකා ඉරාකයේ මිලිටරි වාඩිලෑම දිගටම පවතිනු ඇතැයි ප්‍රකාශයට පත් කල ඔහු පොදු මහජනතාවට එරෙහිව මිලිටරියට ආයාචනා කිරිම මගින් එම පිලිවෙත ආරක්ෂා කිරීමට යත්න දැරී ය. “මෙම යුද්ධය ගෙන යන්නේ කොයි ආකාරයට ද යන වග තීන්දු කිරීමට මා ජනමත විමසුමක් පැවැත්වීමට යන්නේ යැයි අපගේ හමුදාවන් සිතූ වේ නම් ඔවුන් මෙහෙයුම ගැන බෙහෙවින් උත්සුක වීමට ඉඩ තිබුනා” යැයි ඔහු පැවසී ය. “හොඳයි, අපි මෙහි සටනේ සිටින අතරේ අපට සිටින්නේ අපගේ හමුදාවන්ගේ ධෛර්‍යය හීන කරන අවධාන කන්ඩායමක් පවත්වා ගෙන යන ප්‍රධාන අන දෙන නිලධාරියෙක් -- වෙනත් වචනවලින් කිව තොත් ඔහුට අපගේ ආරක්ෂාවට හා නැතිනම් අපගේ මූලෝපායට වඩා දේශපාලනය වැදගත් -- යැයි අපගේ හමුදාවන් කිව්වොත්.”

කාරනාව අවධාරනය කරනු වස් බුෂ් ඊලඟට ප්‍රකාශ කලේ “මෙම සටනේ දී සහයෝගී පදනම් බොහොමයක්” තිබෙන බව යි. ඉන් අනතුරුව සඳහන් කල ලැයිස්තුව තුල ඇමරිකානු ජනතාව එක් සහයෝගී පදනමක් ලෙස පමනක් පෙන්නුම් කෙරුනි. හමුදා ඉවත් කර ගැනීමේ මූලෝපායක්” සරල දෙයක් ලෙස පෙනී යන්න පුලුවන්, එය මැතිවරනවලට බලපාන්නත් පුලුවන්” යැයි බුෂ් පැවසී ය. “නමුත් එය එක්සත් ජනපදය සම්බන්ධයෙන් දිගු කාලීන, බැරෑරුම් ආරක්ෂක ප්‍රතිවිපාක ගෙන එනවා ඇති.”

ඔහු අවධාරනාත්මකව මෙසේ කියාගෙන ගියේ ය: “සමහර විට ඔබ නිවැරදි යැයි සිතන දෙය මත පදනම්ව තීන්දු ගැනීමට ඔබට සිදු වෙනවා. මගේ වැදගත් ම කාර්යය නම් මේ රට ආරක්ෂා කිරීමට උදව් කිරීම යි. එබැවින් ඉරාකය ගැන ගන්නා තීන්දු මුලුමනින්ම එල්ල කෙරෙන්නේ එම කාර්යය ඉටු කිරීමට උදව් කිරීමට යි.”

කෙලින් ම කිය තොත්, මෙයින් අදහස් කෙරෙන්නේ, බුෂ් වෛරී සහගතව හා පිලිකුලෙන් යුක්තව “අවධාන කන්ඩායමකට” සමාන කරන ඇමරිකානු මහජනතාවගේ කැමැත්තට ඉහලින් පවත්නා

ප්‍රමුඛතාවක් එක්සත් ජනපදයේ "ආරක්ෂක" අවශ්‍යතා විසින් අත්පත් කර ගනු ලබන බව යි.

බුෂ් එක්සත් ජනපදයේ ආරක්ෂක අවශ්‍යතා ගැන කතා කරන විට ඔහු කතා කරන්නේ ඇමරිකානු ජනතාවගේ ආරක්ෂාව හා යහ පැවැත්ම ගැන නොවේ. ඔහු කතා කරන්නේ තෙල්වලින් පොහොසත් මැද පෙරදිග අධිපති තත්වයක් තහවුරු කර ගැනීම තමන්ගේ එම අවශ්‍යතාවන්ට කේන්ද්‍රීය කාරනාවක් ලෙස සලකන ඇමරිකානු පාලක ප්‍රභූවේ භූ-දේශපාලනික අවශ්‍යතා ගැන ය.

එපමනක් නොව, ආඥාදායකයකු වීමට පෙරුම් පුරන සෑම පාලකයෙකු ම කියා පාන්නේ සිය අත්තනෝමතික පියවර ගනු ලබන්නේ ජාතික ආරක්ෂාව තහවුරු කිරීම වෙනුවෙන් බව යි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් ඇතුලු අන් සෑම දෙයක් ම එය වෙනුවෙන් කැප කල යුතු ය. "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" නාමයෙන් ව්‍යවස්ථාමය ලෙස ආරක්ෂිත ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට වටලා පහර එල්ල කරනු පිනිස 9/11 සිට ආන්ඩුව විසින් යොදාගනු ලැබ ඇති මූලික තර්කය මෙය යි.

සිය යුද පිලිවෙතට පුලුල් පරිමානයෙන් විරුද්ධ කොටසක් ලෙස ඔහු පිලිගන්නා ඇමරිකානු ජනතාවගෙන් සමන්විත "සහයෝගී පදනම" සම්බන්ධයෙන් සිය මතය ප්‍රකාශ කිරීමෙන් අනතුරුව, බුෂ් සිය පිලිවෙත ඉදිරියට ගෙන යාමෙහි ලා තමන් පදනම් වන සහයෝගී පදනම වෙත අවධානය යොමු කලේ ය. "දෙවන සහයෝගී පදනම නම් මිලිටරිය" යැයි පැවසූ ඔහු මෙසේ ද සඳහන් කලේ යː "සිය ප්‍රධාන අන දෙන නිලධාරියා ඔවුන්ගේ අනාගතය සම්බන්ධයෙන් දේශපාලන තීන්දු ගැනීමක් අපගේ මිලිටරියට අවශ්‍ය නොවේ යන්න ගැන මට හොඳට ම විශ්වාස යි."

බුෂ් සඳහන් කල "තෙවන සහයෝගී පදනම" වූයේ "මිලිටරි පවුල්" ය. ඔවුන් සම්බන්ධයෙන් ඔහු කියා සිටියේ යː "මං හිතන්නෙ නැහැ ඔවුන්ගේ ප්‍රධාන අන දෙන නිලධාරියා ජනප්‍රියත්වය මත පදනම්ව තීන්දු ගැනීමක් ඔවුන්ට අවශ්‍ය ය කියා."

එනයින් ගත් කල, බුෂ් ඉදිරිපත් කරන්නේ මිලිටරිය සමස්තයක් ලෙස ඇමරිකානු ජනතාවට වඩා වැදගත් වෙනම සහයෝගී පදනමක් ලෙස අර්ථ දක්වන සංකල්පයකි.

බුෂ් මිලිටරිය ගැන කතා කරන විට, ඔහු සැඳහුම් කරන්නේ පාලක සංස්ථාපිතය විසින් තුවක්කු උන්ඩවලටත් වඩා අඩු මට්ටමෙන් සලකනු ලබන සාමාන්‍ය සොල්දාදුවන් හෝ ඔවුන්ගේ පවුල් ගැන නො වේ. තථ්‍ය වසයෙන් ගත් කල, සාමාන්‍යයෙන් එක්සත් ජනපද සොල්දාදුවන් අතර ඉරාක යුද්ධයට පවත්නා සහයෝගය සමස්තයක් ලෙස ඇමරිකානු ජනගහනයට වඩා වැඩි නැත.

ස්වාධීනතා ප්‍රකාශනය තුල දී ඇමරිකානු විප්ලවයේ නායකයන් විසින් තුන් වන ජෝර්ජ් රජුට විරුද්ධව ඉදිරිපත් කල ප්‍රධාන දුක්ගැනවිලිවලින් එකක් මතකයට නගා ගැනිම වටනේ යː "ඔහු මිලිටරිය සිවිල් බලයෙන් ස්වාධීන හා එයට වඩා උත්තරීතර දෙයක් බවට පත් කර තිබේ." සත්තකින් ම, ඉන් පසුව වර්ධනය වූ දේශපාලනික හා ව්‍යවස්ථාමය විවාද තුල දී, තෝමස් ජෙෆර්සන් වැනි පුද්ගලයෝ, නිත්‍ය මිලිටරියක පැවැත්ම ඇමරිකානු ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට නිරන්තර තර්ජනයක් වනු ඇතැයි ප්‍රකාශ කරමින්, නිත්‍ය හමුදාවක අන්තරායන් ගැන බලගතු ලෙස අනතුරු ඇඟවූහ.

ඇමරිකානු ජනතාවගේ කැමැත්තට එරෙහිව කැඳවිය යුතු බලයක් ලෙස බුෂ් මිලිටරිය වෙත හැරී ගැනීම මැනවින් හිතාමතා කල දෙයකි. එය ඉතා බැරෑරුම්ව ගත යුතු ය. ප්‍රවෘත්ති සාකච්ඡාව තුල දී වෙනත් කරුනු ගනනාවක් සම්බන්ධයෙන් ඔහු සාරාර්ථ වසයෙන් එම තර්කය ම ගෙන හැර දැක්වී ය.

නිදසුනක් ලෙස, "ගැලප් මත විමසුව හෝ වෙනත් ඕනෑම මත විමසුමකට රටේ ඉරනම තීන්දු කිරීමට ඉඩ දිය" නොහැකි යැයි ඔහු අවධාරනය කලේ ය. තවත් වැඩි පුර හමුදාවන් යැවීමේ හැකියාව බැහැර කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් පසුව ඔහු මෙසේ පැවසී යː "ප්‍රධාන අන දෙන නිලධාරියා මිලිටරි චින්තකයන්ගේ හා සැලසුම්කරුවන්ගේ ඥානය හා විනිශ්චය මත පදනම් විය යුතු ය යන්න තේරුම් ගන්නා ලෙස මම ඇමරිකානු ජනතාවගෙන් කෙලින් ම ඉල්ලා සිටිනවා."

මෙම ප්‍රකාශයේ අන්තර්ගතය නම්, පැන නැගිය හැකි ඕනෑම මහජන විරෝධයකට මුහුන දෙමින්, සිය පාලනාධිකාරය නියෝජනය කරන පාලක ප්‍රභූ කන්ඩායමේ පිලිවෙත් -- යුද්ධය තව දුරටත් තීව්‍ර කිරීම හෝ ඉරානය වැනි සෙසු රටවලට එය පැතිරවීම එයට ඇතුලත් විය හැකි ය -- බලාත්කාරයෙන් ක්‍රියාවට දමනු පිනිස මිලිටරිය මත තමන්ට පවත්නා පාලනය යොදා ගැනීමට බුෂ් ක්‍රියා කරනු ඇත යන්න පිලිබඳ තර්ජනයකි.

මිලිටරි පිලිවෙත තීන්දු කිරීමට දේශපාලනඥයන්ට ඉඩ දිය නොහැකි ය එය කල හැක්කේ ජෙනරාල්වරුන්ට පමනි යන්න අති මූලික මූලධර්මයක් ලෙස ප්‍රකාශ කිරීමෙහි ලා බුෂ් අතිශයින් නිශ්චිත ය. මෙම තර්කය ප්‍රතිගාමී වන්නා සේ ම මුග්ධ එකකි. පලමු කොට ම, බුෂ් මත් දේශපාලනඥයකු වන අතර මිලිටරිය භාරව සිටින ඉහල ජෙනරාල්වරු තෝරා ගනු ලැබ ඇත්තේ පාලනාධිකාරයේ පිලිවෙත ක්‍රියාවට දමනු සඳහා ය. ඔවුන් පාලනාධිකාරයේ පිලිවෙතෙහි නිශ්චිත අංග සමග ගැටුනු කල මිලිටරි නිලධාරින් විස්ථාපනය කිරීමට හෝ සේවයෙන් පහ කිරීමට බුෂ් යලි යලිත් ක්‍රියා කොට ඇත.

දෙවනුව, එම තර්කය මිලිටරිය සිවිල් පාලනයට යටත් කිරීමේ මූලික මූලධර්මය අනෙක් පැත්ත හරවයි. බුෂ්ට අනුව, ජනාධිපති "ඔවුන්ගේ (එනම් මිලිටරියේ) ප්‍රධාන අන දෙන නිලධාරියා" වන්නේ ඔහු මිලිටරියට අවශ්‍ය දෙය කල යුතු ය යන අර්ථයෙනි. එබැවින්, මිලිටරිය මැතිවරනයක ප්‍රතිඵලවලට කීකරු වීම අවශ්‍ය නැතැයි ජනාධිපති තීන්දු කල හොත්, එවිට කිසිවක් කල නොහැකි ය.

බුෂ්ගේ මෙම ප්‍රකාශ සම්බන්ධයෙන් ඩිමොක්‍රැටික් පක්ෂය හෝ මාධ්‍ය වෙතින් වචනයක වත් විරුද්ධත්වයක් පැන නොනැගීම පුදුමයට කාරනාවක් නොවුනත් එය කැපී පෙනෙන සුලු ය. ප්‍රධාන පුවත් පත් ප්‍රවෘත්ති සාකච්ඡාවේ මෙම කොටස වාර්තා නොකල අතර එකඳු ප්‍රමුඛ දේශපාලනඥයෙක් වත් බුෂ්ගේ ප්‍රකාශ තුල දේහානුගතව පැවති මූලික ව්‍යවස්ථාමය මූලධර්මවලට එරෙහි අසාමාන්‍ය ප්‍රහාරය හෙලා දැක්කේ නැත.

බුෂ් පාලනාධිකාරය ඇමරිකානු දේශපාලනයේ ස්වාධීන බලවේගයක් ලෙස මිලිටරියට කරන ආයාචනය හමුවේ දේශපාලන සංස්ථාපිතය පවත්වා ගෙන යන නිහඬතාව නව ප්‍රපංචයක් නම් නොවේ. තථ්‍ය වසයෙන් ගත් කල, 2000 දී බුෂ් බලයට පැමිනියේ අවලංගු වූ මිලිටරි ඡන්ද ගනන් කිරීම වැදගත් ක්‍රියාකලාපයක් ඉටු කලා වූ මැතිවරන කොල්ලයක පදනම මත ය. ඩිමොක්‍රැටික් පක්ෂයේ අපේක්ෂක ඇල් ගෝර් එම අවස්ථාවේ ප්‍රතිචාර දැක්වූයේ තමන්ට මිලිටරියේ සහයෝගය නැතිව ජනාධිපති බවට පත් විය නොහැකි යැයි ප්‍රකාශ කරමිනි.

එදා පටන් මේ දක්වා මිලිටරිය ඇමරිකානු දේශපාලන ජීවිතයේ වඩ වඩා ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කර තිබේ. එක්සත් ජනපද පුරවැසියන් හා පුරවැසියන් නොවන පුද්ගලයන් චෝදනා නොමැතිව දින නියමයක් නැතිව මිලිටරි අත් අඩංගුවේ තබා ගැනීමේ අයිතිය බුෂ් පාලනාධිකාරය තහවුරු කර ගෙන තිබේ. එය, ප්‍රථම වතාවට එක්සත් ජනපදය තුල මිලිටරි ක්‍රියාකාරකම් සම්බන්ධීකරනය කරන උතුරු අන දෙන මධ්‍යස්ථානය නිර්මානය කර ඇත.

දේශීය කටයුතුවලට මැදිහත් වීමට මිලිටරියට ඇති බලතල පුලුල් කිරීමට පාලනාධිකාරය ක්‍රමානුකූලව උත්සාහ කර තිබේ. මිලිටරියට අරමුදල් ලබා දීම වෙනුවෙන් පසු ගිය වසරේ දී සම්මත කෙරුනු ජාතික ආරක්ෂක අධිකාරි පනතට පාලනාධිකාරය ඇතුලු කර ඇති එක් කොටසක් මගින් පොසේ කොමිටටුස් පනත සංශෝධනය කර ඇත්තේ ස්වභාවික ව්‍යසනයක දී, ත්‍රස්ත ප්‍රහාරයක දී හෝ "පොදු පර්යාය පවත්වා ගෙන යාමට රාජ්‍ය නිලධාරින් අපොහොසත් වන තරම් දුරට දේශීය ප්‍රචන්ඩත්වය වර්ධනය වී ඇතැයි ජනාධිපති තීන්දු කරන සෙසු කොන්දේසිවල දී" මිලිටරිය දේශීය අවශ්‍යතා වෙනුවෙන් යෙදවීමට ඉඩ දෙන පරිදි ය.

බුෂ් පාලනාධිකාරයේ ඉහල නිලධාරින් සිවිල් ශ්‍රාවකත්වය ඉදිරියේ කතා කරන්නේ කලාතුරකිනි. බුෂ්ගේ හෝ චෙනීගේ සෑම ප්‍රධාන කතාවක් ම පාහේ කෙරෙන්නේ මිලිටරි ශ්‍රාවකත්වයක් ඉදිරියේ ය.

මෙම අන්තරායන්ට එරෙහි නාමික දේශපාලන විරුද්ධත්වය පවා නිහඬ කිරීම වඩාත් ම කැපී පෙනෙන කරුනක් වන්නේ, තර්ජනය එල්ල වන්නේ මහජන මතයට එරෙහිව පමනක් නො ව දේශපාලන සංස්ථාපිතය තුල ම සිටින පාලනාධිකාරයේ විවේචකයන්ට ද එරෙහිව ය යන කරුන සැලකිල්ලට ගත් කල ය. පාලක ප්‍රභූව තුල පිලිවෙත් පිලිබඳ මතභේද වැඩෙමින් පවතින අතර පාලනාධිකාරයට පවත්නා සහයෝගය කොංග්‍රස් මන්ඩලය තුල ම වේගයෙන් හිඳෙමින් පවතී. වොෂිංටනයේ නිල විවාදය තුල එකඳු කන්ඩායමක් වත් යුද්ධයට විරුද්ධ නැත. එහෙත් ඇමරිකානු අධිරාජ්‍යවාදයේ අවශ්‍යතා රැක ගැනීමට අවශ්‍ය පිලිවෙත කුමක් ද යන්න අරබයා ගැඹුරු මතභේද පවතී.

දේශපාලන සංස්ථාපිතය තුල සියලු ම කන්ඩායම්, ඔවුන්ගේ උපායික මතභේද මොනවා වුවත්, තථ්‍ය වසයෙන් ම, ඇමරිකානු මහජන මතය නමැති "සහයෝගී පදනම" කෙරෙහි දක්වන ඔවුන්ගේ භීතිය සම්බන්ධයෙන් එකමුතු ය. මෙම කොන්දේසි යටතේ, ජනාධිපති-මිලිටරි ආඥාදායකත්වයක් දෙසට වඩා විවෘත හැරීමක තර්ජනය වඩා යථාර්ථයකි.

මැතිවරනයක් පිලිවෙත් සම්බන්ධයෙන් කිසිදු බලපෑමක් ඇති කල නොහැකි නම්. ආන්ඩුවේ පිලිවෙත වෙනස් කිරීමට දැරෙන මොන යම් හෝ ප්‍රයත්නයකට ප්‍රතිහාරයක් ලෙස මිලිටරියේ බලය ඔසවා තැබෙයි නම්, ජනතාව ඉදිරියේ පවත්නා විකල්පය කුමක් ද? මෙහි දී ස්වාධීනතා ප්‍රකාශනයෙන් තවත් ජේදයක් උපුටා දැක්වීම වටනේ ය.

"මොන යම් හෝ රූපාකාරයක ආන්ඩුවක් වුව මේවාට (ජනතාවගේ අයිතීන්ට) විනාශකාරී බවට පත් වන ඕනෑ ම විටක එය වෙනස් කොට හෝ අහෝසි කොට, තමන්ගේ ආරක්ෂාව හා සන්තුෂ්ටිය සාක්ෂාත් කර ගැනීමට බෙහෙවින් ම ඉඩ ඇතැයි ඔවුන්ට පෙනෙනු ඇති ආකාරයේ මූලධර්ම මත පදනම් දමමින් හා එවන් රූපාකාරයෙන් බලය සංවිධානය කරමින් නව ආන්ඩුවක් සංස්ථාපනය කර ගැනීම මහජනතාවගේ අයිතිය යි. . . . උල්ලංඝනයන්ගේ හා අයුක්ති සහගත අල්ලා ගැනීම්වල දීර්ඝ ක්‍රියාදාමයක්, නොවැලැක්විය හැකි ලෙස එම අරමුන ම පසුපස හඹා යමින්, ඔවුන් පූර්න ආඥාදායක තන්ත්‍රයකට යටත් කිරීමේ සැලසුමක් බවට ඔප්පු වන විට, එවන් ආන්ඩුවක් බලයෙන් පහ කොට සිය අනාගත සුරක්ෂිත භාවය වෙනුවෙන් නව ආරක්ෂනයන් සපයා ගැනීම ඔවුන්ගේ අයිතිය හා ඔවුන්ගේ යුතුකම වේ."



© www.wsws.org